# IBAC විශේෂ වාර්තා සහ ස්වභාවික සාධාරණත්ව ක්‍රියාවලිය

## තොරතුරු පත්‍රිකාව

### IBAC විශේෂ වාර්තාවල කාර්යභාරය

IBAC හි එක් කාර්යයක් වන්නේ විශේෂ වාර්තා ප්‍රකාශයට පත් කිරීම හරහා රාජ්‍ය අංශයේ දූෂණ හා පොලිස් විෂමාචාරයන් පිළිබඳ දැනුවත් කිරීම සහ ඒවා වැළැක්වීමයි.

IBAC හට ඕනෑම අවස්ථාවක දී එහි රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ විශේෂ වාර්තාවක් ප්‍රකාශයට පත් කළ හැකිය. සැකසහිත 'දූෂිත ක්‍රියාවක්' විමර්ශනය කිරීම පිළිබඳ විශේෂ වාර්තාවක් මෙයට ඇතුළත් වේ.

විශේෂ වාර්තාවක් යනු පොදු ලියවිල්ලක් වන අතර එය IBAC පිළිබඳ සවිස්තරාත්මක කරුණු සැපයිය හැකි විමර්ශනයකි. සාක්ෂි පිළිබඳ සාකච්ඡාවක් හා විභාග කිරීමක්, සහ මෙම සාක්ෂි මත පදනම්ව IBAC හි සොයාගැනීම් සහ නිර්දේශ මෙයට ඇතුළත් විය හැකිය.

IBAC විශේෂ වාර්තාවලට පහත දැක්වෙන දේ ඇතුළත් විය හැකිය:

- විමර්ශනයට සම්බන්ධ වූ පුද්ගලයන් හෝ ආයතන පිළිබඳ අදහස් දැක්වීම්
- ඔවුන් සම්බන්ධ වූ ආකාරය
- විමර්ශනයට ලක්ව ඇති හැසිරීමේදී ඔවුන් ඉටු කළ වැඩ කොටස

වාර්තාව මගින් පුද්ගලයන් හෝ ව්‍යාපාර ඒවායේ නමින් හෝ අන්වර්ථ නාමයෙන් (නම/ව්‍යාජ නම වෙනස් කිරීමෙන්) හඳුනා ගත හැකිය.

සමහර විට IBAC විසින් මෙහෙයුමකට සම්බන්ධ සාක්ෂිකරුවන් හෝ පාර්ශවයන් පිළිබඳව අහිතකර අදහස් දැක්වීම් හෝ මතයන් ඉදිරිපත් කරයි. පුද්ගලයෙකු පිළිබඳ 'අහිතකර අදහස් දැක්වීමක් හෝ මතයක්' යනු ඔවුන්ගේ බැඳියාවන් (උදාහරණයක් ලෙස ඔවුන්ගේ කීර්තිය හෝ රැකියාව) කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි එකකි.

IBAC විසින් සාක්ෂිකරුවන්ගේ යහපැවැත්ම වෙනුවෙන් සහයෝගය දැක්වීමේ හා ආරක්ෂාව සැපයීමේ සිය වගකීම බැරෑරුම් ලෙස සලකන අතර විශේෂ වාර්තාවක අහිතකර ලෙස සඳහන් කර ඇති සියලුම පුද්ගලයින්ට වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට පෙර ප්‍රතිචාර දැක්වීමට සාධාරණ අවස්ථාවක් ලබා දෙනු ඇත.

### ස්වභාවික සාධාරණත්ව ක්‍රියාවලිය

ස්වාභාවික සාධාරණත්වය යනු පුද්ගලයෙකුට බලපෑ හැකි පරිපාලන තීරණයක් පිළිබඳව දැනුවත් වීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා ඇති අයිතියයි.

IBAC විශේෂ වාර්තාවක සන්දර්භය තුළ මෙයින් අදහස් වන්නේ IBAC විසින්පු ද්ගලයෙකුට අහිතකර විය හැකි අදහස් දැක්වීම් හෝ මතයන් ඇතුළත් කිරීමට අදහස් කරන විට, එම අදහස් දැක්වීම් වලට හෝ මතයන්ට ප්‍රතිචාර දැක්වීමට අප එම පුද්ගලයාට සාධාරණ අවස්ථාවක් ලබා දෙන බවය.

අහිතකර අදහස් දැක්වීමකට හෝ මතයකට භාජනය වන පුද්ගලයෙකුට IBAC විසින් විශේෂ වාර්තාවක ඇතුළත් කිරීමට අදහස් කරන අහිතකර කරුණු තේරුම් ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත්

තොරතුරු ලබා දීම ස්වාභාවික සාධාරණත්ව ක්‍රියාවලියට අවශ්‍ය වේ. මෙයට ඇතුළත් වන්නේ සාක්ෂිකරුවන්ට ඔවුන්ගේම විභාග පිටපතක් (ඔවුන් විභාගයකට ලක් වූයේ නම්) ලබා දීමය.

**ස්වභාවික සාධාරණත්වය: නීතියෙන් අවශ්‍ය වේ**

Independent Broad-based Anti-corruption Commission Act 2011 (ස්වාධීන පුළුල් පදනමකින් යුත් දූෂණ විරෝධී කොමිෂන් සභා පනත) (IBAC පනත)162 වගන්තිය මගින් විශේෂ වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමට පෙර IBAC අනුකූල විය යුතු සියලුම අවශ්‍යතාවන් විදහා දක්වා ඇත.

ඒවාට ඇතුළත් වන්නේ:

- පුද්ගලයන් පිළිබඳව IBAC විසින් විශේෂ වාර්තාවක ඇතුළත් කිරීමට අදහස් කරන ඕනෑම අහිතකර අදහස් දැක්වීමකට හෝ මතයකට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට සාධාරණ අවස්ථාවක් ලබා දීම
- ඕනෑම අහිතකර සොයාගැනීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය ආයතනවලට හා ඒවාට අදාළ ප්‍රධාන නිලධාරියාට සාධාරණ අවස්ථාවක් ලබා දීම
- ප්‍රතිචාරයක් ලබා දී ඇත්නම්, IBAC විසින් විශේෂ වාර්තාව තුළ එම ප්‍රතිචාරයේ එක් එක් අංග සාධාරණ ලෙස විදහා දැක්විය යුතුය.

## විශේෂ වාර්තාවක ඇතුළත් කළ හැකි හා නොකළ හැකි දේ මොනවාද

- IBAC හට පුද්ගලයෙකු පිළිබඳ අහිතකර නොවන අදහසක් දැක්වීමක් හෝ මතයක් ඇතුළත් කිරීමට අවශ්‍ය නම්, එවිට අදාළ තොරතුරු එම පුද්ගලයාට සැපයිය යුතුය. සාමාන්‍යයෙන් මෙය කෙටුම්පත් වාර්තාවේ අදාළ කොටස්වල පිටපතක් වනු ඇත.
- IBAC අපරාධ විමර්ශනයක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගැන දන්නේ නම්, එම ක්‍රියාවලියට අගතියක් වන කිසිදු තොරතුරක් IBAC විසින් විශේෂ වාර්තාවක ඇතුළත් නොකළ යුතුය.
- යම් පුද්ගලයෙකු අපරාධ හෝ විනයානුකූල වරදක් සම්බන්ධයෙන් වැරදිකරුවෙකු බව, හෝ එවැනි වරදක් සිදු කර ඇති බව, හෝ සිදු කරමින් සිටින බව, හෝ සිදු කිරීමට සූදානම් වන බවට තිබෙන සොයා ගැනීමක් හෝ මතයක් IBAC විසින් ඇතුළත් නොකළ යුතුය.
- අපරාධ හෝ විනයානුකූල වරදක් සම්බන්ධයෙන් පුද්ගලයෙකුට නඩු පැවරිය යුතු බවට මතයක් නිර්දේශ කිරීමට හෝ සැපයීමට IBAC හට නොහැක.

IBAC පහත දැක්වෙන දේ හෙළි නොකළ යුතුය:

- වික්ටෝරියා පොලිස් පනත 2013 (එනම් විනය ක්‍රියාමාර්ගයක්) යටතේ මග පෙන්වීමක් ලැබී ඇති පුද්ගලයෙකුගේ අනන්‍යතාවය
- මහජන යහපත සම්බන්ධ පැමිණිල්ලක්
- IBAC නිලධාරියෙකු විසින් මත්ද්‍රව්‍ය හෝ මධ්‍යසාර සාම්පල සැපයීම සම්බන්ධ කරුණු.

**අහිතකර අදහස් දැක්වීමකට හෝ මතයකට අදාළ නොවන පුද්ගලයෙකුව හඳුනා ගතහැකි තොරතුරු ඇතුළත් කිරීමට පෙර යම් කොන්දේසි සපුරා ඇති බවට IBAC සෑහීමට පත් විය යුතුය. මෙම කොන්දේසි වලට ඇතුළත් වන්නේ:**

- එය මහජන යහපත සඳහා වීම
- එමගින් පුද්ගලයාගේ කීර්ති නාමයට, ආරක්ෂාවට හෝ යහපැවැත්මට අයුක්ති සහගත හානියක් සිදු නොවන බවට සෑහීමට පත් වීම
- පුද්ගලයා අහිතකර අදහස් හෝ මතයට යටත් නොවන බව වාර්තාවේ සඳහන් කිරීම.

## අහිතකර අදහස් දැක්වීමකට හෝ මතයකට යටත්ව මියගිය පුද්ගලයන්

විශේෂ වාර්තාවක් තුළ මියගිය පුද්ගලයෙකු පිළිබඳ අහිතකර අදහස් දැක්වීමක් හෝ මතයක් ඇතුළත් වන විට, IBAC විසින් ළඟ ම ඥාතියාට සහ/හෝ බලකරුවන්ට ප්‍රමාණවත් තොරතුරු ලබාදෙන බව සහ අහිතකර අදහස් දැක්වීමට හෝ මතයට ප්‍රතිචාර දැක්වීමට, ඔවුන් එසේ කිරීමට තෝරා ගන්නේ නම්, සාධාරණ අවස්ථාවක් ලබාදෙන බව සහතික කරනු ඇත.

## ස්වභාවික සාධාරණත්ව කාල ගණනය

විමර්ශනයක් සිදු කිරීමට හා ඒ ආශ්‍රිත විශේෂ වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමට කොපමණ කාලයක් ගතවේද යන්න ඇස්තමේන්තු කිරීමට IBAC හට අපහසුය.

විශේෂ වාර්තාවක් සම්පූර්ණ කිරීමට ගතවන කාලය සඳහා පහත දැක්වෙන දේ ඇතුළු කරුණු ගණනාවක් මගින් බලපෑම් ඇති කළ හැකිය:

- විමර්ශනයේ වපසරිය හා සංකීර්ණත්වය
- සම්බන්ධ වූ පුද්ගලයන් හෝ පොදු ආයතන සංඛ්‍යාව
- IBAC විසින් රැස් කර ගන්නා ලද කරුණු ප්‍රමාණය
- ස්වභාවික සාධාරණත්ව ක්‍රියාවලියේ කාලසීමාව
- නීතිමය ප්‍රමාදයන්

විමර්ශනයක් මුල සිට අවසන් වන තුරු ම හා ස්වභාවික සාධාරණත්ව ක්‍රියාවලිය අතරතුර ඇස්තමේන්තුගත කළ ගණනයන් හා ප්‍රමාදයන් පිළිබඳව සාක්ෂිකරුවන් යාවත්කාලීනව තබා ගැනීමට IBAC කැපවී සිටී.

ස්වභාවික සාධාරණත්ව ක්‍රියාවලියට සම්බන්ධ සියලුම පාර්ශවයන් හෝ පුද්ගලයන්ට විවිධ මට්ටමේ සංකීර්ණතා සහිත කරුණු තිබෙනු ඇත. සමහරුන් සඳහා ක්‍රියාවලිය ඉක්මන් විය හැකි අතර, අනෙක් අය සඳහා එය දිගු හා වඩාත් සංකීර්ණ විය හැකිය.

## රහස්‍යභාවය හා අනාවරණය නොකිරීමේ විධිවිධාන

විශේෂ වාර්තා කෙටුම්පතක පිටපතක් ලැබෙන ඕනෑම අයෙකු දැඩි රහස්‍ය විධිවිධානවලට යටත් වේ.

කෙටුම්පත් වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමට පෙර එහි අන්තර්ගතයන් හෝ සොයාගැනීම් සාකච්ඡා කිරීම සාපරාධී වරදකි. එසේ නොවන්නේ ඔබ:

- IBAC වෙතින් ලිඛිතව අවසරය ගෙන ඇත්නම් (මෙයට ඔබේ ලියාපදිංචි වෛද්‍යවරයා හෝ සන්ධිත සෞඛ්‍ය වෘත්තිකයා සමඟ සාකච්ඡා කිරීමට ලබාදෙන අවසරය ඇතුළත් විය හැකිය)
- යෝජිත වාර්තාව සම්බන්ධව නීති උපදෙස් හෝ නියෝජනයක් අපේක්ෂා කරමින් සිටින්නේ නම්
- IBAC හෝ IBAC නිලධාරියෙකුගේ හැසිරීම සම්බන්ධයෙන් Victorian Inspectorate (වික්ටෝරියානු පරීක්ෂක කාර්යාලය) වෙත පැමිණිල්ලක් කරමින් සිටින්නේ නම් හෝ වික්ටෝරියානු පරීක්ෂක කාර්යාලය විසින් නිකුත් කරන ලද කැඳවීමකට ප්‍රතිචාර දක්වමින් සිටින්නේ නම්.

ඔබට මෙම ලැයිස්තුවෙන් පිටත කෙනෙකු සමඟ කරුණු සාකච්ඡා කිරීමට අවශ්‍ය නම්, කරුණාකර මෙහෙයුම පවරා ඇති IBAC විමර්ශකයා අමතන්න.

## නෛතික උපදෙස් හා නෛතික නියෝජනය

ස්වභාවික සාධාරණත්ව ක්‍රියාවලිය අතරතුර ඕනෑම අවස්ථාවක දී ඔබට නෛතික උපදෙස් ලබාගත හැකිය. ඔබට ඔබේම නීති වෘත්තිකයෙකු නොමැති නම්, කරුණාකර පහත සම්පත් සලකා බලන්න:

- **Law Institute of Victoria** (වික්ටෝරියා නීති ආයතනය) හි නීතිමය යොමු කිරීමේ සේවාව. එහි ඔබට ප්‍රවේශ විය හැකි පුද්ගලික නීතීඥයින්ගේ ලැයිස්තු තිබේ නීතිමය යොමු කිරීමේ සේවාවෙහි ඇතුළත් සියලුම නීති සමාගම් නොමිලේ විනාඩි 30 ක සම්මුඛ පරීක්ෂණයක් ලබා දෙයි.  නෛතික ගැටලුව පිළිබඳව වැඩි විස්තර අවබෝධ කර ගැනීමට සහ ලබාගත හැකි විකල්ප හා ඒවාට කොපමණ මුදලක් වැය වේද යන්න සාකච්ඡා කිරීමට ඔබට මෙම සම්මුඛ පරීක්ෂණය භාවිතා කළ හැකිය.

  ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, කරුණාකර (03) 9607 9550 ඔස්සේ නීතිමය යොමු කිරීමේ සේවාව අමතන්න, නැතහොත් **www.liv.asn.au/referral** වෙත පිවිසෙන්න

- **Victoria Legal Aid** (වික්ටෝරියා ලීගල් ඒඩ්) ආයතනයට අපරාධ නීතිය හා සිවිල් නීතිය සම්බන්ධ කරුණු ගැන ඔබට උදව් කළ හැකිය. සමහර සේවාවන් සෑම කෙනෙකුටම ලබා ගත හැකි අතර, අනෙක් සේවාවන් පිරිනමනු ලබන්නේ සුදුසුකම් ඇති පුද්ගලයින්ට පමණි.

  ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, කරුණාකර1300 792 387 අමතන්න, නැතහොත් **www.legalaid.vic.gov.au** වෙත පිවිසෙන්න

- **Victorian Aboriginal Legal Service Co-operative Limited (VALS)** විසින් වික්ටෝරියාව තුළ සිටින ආදිවාසීන්ට සහ ටෝරස් සමුද්‍රසන්ධි දූපත් වැසියන්ට යොමු කිරීම්, උපදෙස්/තොරතුරු, රාජකාරී කටයුතු හෝ විෂයභාර කටයුතු සඳහා සහාය සැපයීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අපරාධ හෝ සිවිල් නීතිය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති VALS හි සොලිසිටර්වරුන්ට ඔබට සහාය වීමට හැකි වනු ඇත.

  වැඩි විස්තර සඳහා, කරුණාකර **1800 064 865** ඔස්සේ VALS අමතන්න, නැතහොත් **www.vals.org.au** වෙත පිවිසෙන්න.

## සාක්ෂිකරුවන්ගේ යහපැවැත්ම සඳහා සහාය ලබා ගත හැකිය

IBAC මෙහෙයුමක් පුරාවට IBAC හි රාජකාරි, කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමට යටත්ව සාක්ෂිකරුවන්, උනන්දුවක් දක්වන පුද්ගලයින්, හා වෙනත් පුද්ගලයින් සමඟ නිරන්තර සන්නිවේදනයක් පවත්වාගෙන යාම සහතික කරන කැපයීමෙන් යුතුව කටයුතු කරන සාක්ෂිකරුවන් සම්බන්ධ කරන කණ්ඩායමක් IBAC තුළ සිටියි.

සාක්ෂිකරුවන් සම්බන්ධ කරන නිලධාරීන් සාක්ෂිකරුවන්ට උපදේශන සේවා හා සම්පත් පිළිබඳ තොරතුරු හෝ ඒ සඳහා යොමු කිරීම් ලබා දෙනු ඇත. සාක්ෂිකරුවන් සම්බන්ධ කරන සම්බන්ධතා නිලධාරීන් උපදේශනය ලබා දීම හෝ සාක්ෂිකරුවන් සමඟ චිකිත්සක සම්බන්ධතාවයක් ඇති කර ගැනීම සිදු නොකරයි.

ඔබ ඔබේ යහපැවැත්ම ගැන සැලකිලිමත් වන්නේ නම් හා ඔබට උපදේශන සහාය අවශ්‍ය නම්, ඔබට 1300 687 327 ඔස්සේ IBAC හි ස්වාධීන, නොමිලේ ලබාගත හැකි හා රහස්‍ය සාක්ෂි සුභසාධන සැපයුම්කරු වන, Converge International, වෙත ප්‍රවේශ විය හැකිය. Converge විසින් ඇමතුම් සඳහා දවසේ පැය 24 පුරා, සතියේ දින හතේම පිළිතුරු ලබා දෙයි. මෙම සේවාව භාවිතා කරන විට, ඔබ සාක්ෂිකරුවෙකු හෝ IBAC මෙහෙයුමකට සම්බන්ධ වී සිටින බව Converge වෙත දැනුම් දීම උපකාරී වේ.

උපදේශන සේවාවන්ට ඔබට ආරක්ෂිත සහ සහාය දක්වන පරිසරයක ඔබේ හැඟීම් සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දිය හැකිය. IBAC මෙහෙයුමක් සම්බන්ධව ඔබට සහාය අවශ්‍ය නම්, ඔබේ මානසික සෞඛ්‍යය හා යහපැවැත්ම සහ ඔබේ රහස්‍ය නිවේදනයේ ඇති කරුණු ගැන ඕනෑම දෙයක් ලියාපදිංචි සෞඛ්‍ය වෘත්තිකයකු සමඟ සාකච්ඡා කිරීමට ඔබට අවසරය ඇත.

ඔබට භාෂණ පරිවර්තකයෙකු, සංචලතා සහාය, හෝ විභාග පරිසරයට වෙනස් කිරීම් සිදු කිරීමට අවශ්‍ය නම් හෝ යහපැවැත්ම සඳහා ඔබට ලබා ගත හැකි සහාය පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබට අවශ්‍ය නම්, සාක්ෂිකරුවන් සම්බන්ධ කරන කණ්ඩායමට **witnessliaison@ibac.vic.gov.au** ඔස්සේ විද්‍යුත් තැපැල් පණිවිඩයක් යවන්න, නැතහොත් සාක්ෂිකරුවන්ගේ සුභසාධන තොරතුරු පත්‍රිකාව වෙත යොමු වන්න.

## පැමිණිල්ලක් කිරීම

ඔබට IBAC පිළිබඳව හෝ එහි නිලධාරීන්ගේ හැසිරීම පිළිබඳව පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය නම්, 1800 518 197 ඔස්සේ Victorian Inspectorate (වික්ටෝරියානු පරීක්ෂක කාර්යාලය) අමතන්න, නැතහොත් **www.vicinspectorate.vic.gov.au** වෙත පිවිසෙන්න.

ඔබ IBAC තීරණයට එකඟ නොවන්නේ නම් ඔබ කළ යුතු දේ ඇතුළු වැඩි විස්තර සඳහා, කරුණාකර **www.ibac.vic.gov.au** වෙත යොමු කරන්න.

## ඔබට වැඩි තොරතුරු අවශ්‍ය නම්, කරුණාකර:

**1300 735 135** ඔස්සේ IBAC අමතන්න

(උදේ 10 සිට සවස 4 දක්වා, සදුදා සිට සිකුරාදා, රජයේ නිවාඩු දිනයන් හැර)

IBAC වෙත ඊමේල්පණිවුඩයක් යවන්න **info@ibac.vic.gov.au** හෝ අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න **www.ibac.vic.gov.au**

Interpreter

ඔබට පරිවර්තනය සඳහා උදව් අවශ්‍ය නම්, පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව අමතන්න **13 14 50** ඔස්සේ හෝ **www.ibac.vic.gov.au/mylanguage** වෙතින්



ibac | Strengthening Victoria's Integrity